www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන් සඳහා සමාජවාදී ක්‍රියාමාර්ගයක්

A socialist program for Sri Lankan plantation workers

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2009 සැප්තැම්බර් 09**

හාම්පුතුන් හා ආන්ඩුව සමග සහයෝගී වෙමින් දරිද්‍රතා මට්ටමේ වැටුප් ගිවිසුමක් පැටවීම සඳහා වෘත්තීය සමිති සූදානම් වෙමින් සිටින බව සමාජවාදී සමානතා පක්ෂය (සසප) වතු කම්කරුවන් වෙත අනතුරු අඟවා සිටියි. වෘත්තීය සමිතිවල මෙම උප්පරවැට්ටි ප්‍රතික්ෂේප කරමින් තම වැටුප් හා ජීවන තත්ත්වයන් රැකගැනීම සඳහා සමාජවාදී පිලිවෙත් මත පදනම් වෙමින් ස්වාධීනව ඒකරාශී වන ලෙස අපි වතු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

ලංකා වතු කම්කරු සංගමය (සීඩබ්ලිව්සී), ලංකා ජාතික වතු කම්කරු සංගමය (එල්ජේඊඩබ්ලිව්යූ) හා එකාබද්ධ වතු වෘත්තීය සමිති මධ්‍යස්ථානය (ජේපීටීයූසී) යන සාකච්ඡාවලට සම්බන්ධවූ වෘත්තීය සමිති ඔවුන්ගේ ආරම්භක ඉල්ලීම් පවා දැනටමත් අකුලාගෙන ඇත. මෙම සාකච්ඡා තේ, රබර් හා පොල් වතු කම්කරුවන් පන් ලක්ෂයකට බලපායි. 2007 වසර මුල ඔවුන්ට ලැබුන අවසාන වැටුප් වැඩිවීමෙන් පසුව සියයට 55 කින් ඉහල ගොස් තිබෙන ජීවන වියදම මගින් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් කාබාසිනියා වී ගොසින්ය.

මුල් සාමූහික ගිවිසුම පසුගිය මාර්තුවේ අවසන් වීමෙන් පසුව වෘත්තීය සමිති, මුලින් ඉල්ලා සිටි රුපියල් 750 ක (එජ ඩොලර් 6.54 ක) දෛනික වැටුප වහාම රුපියල් 500 දක්වා කප්පාදු කලේය. ලංකා හාම්පුතුන්ගේ සංගමය (සීඊඑෆ්) වෘත්තීය සමිති ඉල්ලීම එක එල්ලේ ප්‍රතික්ෂේප කිරීමත් සමඟ සැප්තැම්බර් 07 දින හයවන සාකච්ඡා වටය බිඳ වැටුනි. හාම්පුතුන් ඉදිරිපත් කලේ, පාන් ගෙඩියක් ගැනීමටවත් නොසෑහෙන රුපියල් 30 ක් මේ වසර සඳහාත් ලබන වසරට රුපියල් 40 ක වැටුප් වැඩිකිරීමක් පමනි.

සැප්තැම්බර් 08 දින මාධ්‍ය සාකච්ඡාවක දී සීඩබ්ලිව්සී නායක ආරුමුගම් තොන්ඩමන් ඉගි කලේ රුපියල් 400 ක් දක්වා තවත් පල්ලම් බැසීමක් ය. "කම්කරුවන් (වැඩකරන දින 25 ක) මාසයකට රුපියල් 12,500 ක වැටුපක් ලැබිය යුතු වුවත් අවම වශයෙන් රුපියල් 10,000 ක් වත් ඔවුන්ට හිමි විය යුතුය" යි ඔහු කියා සිටියේ ය. දැනට දිනකට ලැබෙන රුපියල් 200 ක සොච්චම් මූලික වැටුපට අමතරව රුපියල් 70 ක පැමිනීමේ දීමනාවක් හා තවත් අමතර රුපියල් 20 ක දීමනාවකි.

සැප්තැම්බර් 2 දින ආරම්භ කල "සහයෝගය නොදීමේ" සීමිත විරෝධතා ව්‍යාපාරයකට වෘත්තීය සමිති කොටුවී සිටියි. කොලඹට තේ කොල ප්‍රවාහනය හා වතු අධිකාරීන්ගේ බංගලාවල වැඩකිරීම අත්හිටුවීමක් ක්‍රියාවට නගා තිබේ.

වතු සමාගම් සමඟ පමනක් නොව ආන්ඩුව සමග ද ගැටුමකට මැදිවන බව දන්නා සමිති තුන, මොනම වැඩ වර්ජනයක් හෝ තහනම් කර තිබේ. ගැඹුරු මූල්‍ය අර්බුදයකට මුහුනපා සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ "ජාතිය ගොඩනැඟීමේ ආර්ථික යුද්ධයක්" ප්‍රකාශයට පත්කර, කම්කරුවන් ද සෙබලුන් මෙන් කැපකිරීම් කල යුතු යයි අවධාරනය කර ඇත.

වෘත්තීය සමිති ආන්ඩුවට එරෙහිව සටන් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ ඔවුන්ගේ දේශපාලන බැඳීම් නිසාය. දේශපාලන පක්ෂයක් ලෙස ද කටයුතු කරන සීඩබ්ලිව්සී, රාජපක්ෂගේ පාලක සන්ධානයේ හවුල් කරුවෙකි. තොන්ඩමන් කැබිනට් ඇමති ධුරයක් හොබවන අතර අනෙකුත් සීඩබ්ලිව්සී නිලධරයන් නියෝජ්‍ය ඇමතිකම් හා පලාත් සභා ඇමතිකම් දරා සිටියි. ඒකාබද්ධ වතු වෘත්තීය සමිති සංගම් මධ්‍යස්ථානයට අනුබද්ධ සමිති දෙකක් පාලනය කරන්නේ රාජපක්ෂ ආන්ඩුවේ තවත් හවුල්කරුවන් දෙදෙනෙකු වන ලංකා සම සමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය යි. ලංකා ජාතික වතු කම්කරු සංගමය, වැඩකරන ජනතාවගේ ජීවන තත්ත්වයන්ට පහර දීමේ දිගු වාර්තාවකට හිමිකම් කියන දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයට (එජාප) අනුබද්ධය.

වැටුප් සාකච්ඡාවන්ට සම්බන්ධ නොවන සමිති, ඊට වඩා වෙනස් නොවේ. කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) සැප්තැම්බර් 6 වන දින පැවති රැස්වීමක දී සිය ප්‍රාදේශීය නායකයන්ට කියා සිටියේ කුමන හෝ වෘත්තීය ක්‍රියාමාර්ගයක් අවහිර කරන ලෙසයි. කැබිනට් ඇමතිවරයෙකු ද වන යූපීඑෆ් හි නායක පී චන්ද්‍රසේකරන්, යුක්තිසහගත වැටුප් වැඩිවීමක් සහතික කිරීම සඳහා මැදිහත්වී කම්කරුවන් විසින් ගන්නා කුමන හෝ ක්‍රියාමාර්ගයක් "වැලැක්වීමට" පියවර ගන්නා ලෙස 7 වන දින ජනාධිපති රාජක්ෂ වෙත ලිපියක් යවමින් ඉල්ලා සිටියේ ය.

රාජපක්ෂ මැදිහත්කර ගැනීමට කෙරෙන ඇරයුම වනාහි, වතු කම්කරුවන්ගේ කුමන හෝ අරගලයක් බිඳ හුදෙකලා කිරීමට වෘත්තීය සමිති තමන්ට කල හැකි සෑම දෙයක්ම කරන බවට නිකුත් වන පැහැදිලි අනතුරු ඇඟවීමකි. පසුගිය සිව් වසර පුරාම ජනාධිපති රාජක්ෂ යලි යලිත් "මැදිහත්ව" ඇත්තේ කම්කරුවන්ට ආධාර කිරීමට නොව, ඔවුන්ගේ ඉල්ලීම් යටපත් කිරීම සඳහා ය. 2006 වසර අගභාගයේදී ඔහු, තම ආන්ඩුවේ වාර්ගික යුද්ධයට බාධා කරමින් බෙදුම්වාදී එල්ටීටීඊ යට උදව් කරන්නේ යයි වතු කම්කරුවන්ට චෝදනා නැඟීය. සියලු සමිති වල සහයෝගය ඇතිව ඔහු, නාමික වැටුප් වැඩිවීමක පදනම මත වැඩ වර්ජනය අවසන් කලේය.

සැප්තැම්බර් 8 දින පැවති මාධ්‍ය හමුවක දී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධ සමස්ත ලංකා වතු කම්කරු සංගමය ද රාජපක්ෂගේ මැදිහත්වීමක් ඉල්ලා සිටියේය. ජනාධිපති එසේ කිරීමට අසමත් වුවහොත් කම්කරු අරගලය නිසා "ආන්ඩුවට දේශපාලන අර්බුදයකට මුහුනපෑමට සිදුවනු ඇතැයි" සමිතියේ නායක කේ ඩී ලාල් කාන්ත අනතුරු ඇඟවීය.

සමස්ත ලංකා වතු කම්කරු සංගමය අනෙකුත් සමිතිවලට සටන්කාමී ආදේශකයක් ලෙස පෙනී සිටියි. කෙසේ වෙතත් ජවිපෙ, රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයේ ඝෝෂාකාරී ආධාරකරුවෙකු වනවාට අමතරව, ආන්ඩුවේ දැවැන්ත යුද අයවැය සඳහා සිය ඡන්දය පාවිච්චි කර තිබේ. එහි වෘත්තීය සමිති ආන්ඩුවට මුහුන දෙනවා වෙනුවට සෑම විටම කර ඇත්තේ, ඔවුන්ගේ උද්ඝෝෂන නතර කර අකුලා ගැනීමයි. යුද්ධයේ අවසානය ජවිපෙ ආස්ථානය වෙනස් කරනු නැත. ආර්ථිකය නගා සිටුවීම සඳහා එම පක්ෂය තමන්ගේ ම ජාතිය ගොඩනැඟීමේ වැඩ පිලිවෙලක් ඉදිරිපත් කර ඇති අතර නොවරදවා ම එහි අර්ථය වනු ඇත්තේ වැඩකරන ජනතාවගේ ජීවන තත්ත්වයන් බිල්ලට දීමයි.

සිය තරගකාරී තේ නිපදවන රටවල කම්කරුවන්ගේ පහත් වැටුප් ගැන සඳහන් කරමින් කොලඹ තේ වෙලඳුන්ගේ සංගමය, කිසිදු මූලික වැටුප් වැඩිවීමක් ප්‍රතික්ෂේප කර ඇත. වතු සමාගම් ද අපනයන්ගේ හැකිලීම හා තේ, රබර් මිල ගනන් පහත වැටීම වෙත ඇඟිල්ල දිගු කොට ඇත. හාම්පුතුන් අවධාරනය කරන්නේ කුමන හෝ වැටුප් වැඩිවීමක් නිෂ්පාදනය ඉහල නැංවීමට බද්ධ කල යුතු බවයි.

පසුගිය සතියේ නිකුත්කල ප්‍රකාශයකින් වතු හිමියන්ගේ සංගමය අනතුරු අඟවා ඇත්තේ "වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වලින් වතුවල කටයුතු වලට සිදුවන කුමන හෝ අවහිරවීම් නිසා රටේ ආර්ථිකයට හා ආරක්ෂාවට දැඩි බලපෑමක් ඇති කල හැකි" බවයි.

මෙම ප්‍රකාශ වනාහි, ආන්ඩුවේ සහාය වෙනුවෙන් මෙන්ම, වෘත්තීය ක්‍රියාමාර්ගය තලා දැමීම සඳහා ආරක්ෂක යාන්ත්‍රනය යොදාගැනීමට කෙරෙන පැහැදිලි ඇරයුමකි. හාම්පුතුන් කන්ඩායම දැනටමත් වතුකරයේ "තත්ත්වය" පිලිබඳව ආරක්ෂක ලේකම්ට හා පොලිස්පතිට දැනුම්දී තිබේ.

සමිති කෙරෙහි ඇති ගැඹුරු අවිශ්වාසය පලකරමින් කම්කරුවෝ, "සහයෝගය නොදීමේ" ව්‍යාපාරය ඉක්මවා යමින්, සුක්කානම තමන් අතට ගැනීමට පටන් ගෙන තිබේ. නෙලන දලු ප්‍රමානය හා තේ කම්හල් වල නිෂ්පාදනය පහත හෙලමින් බෙහෝ වතුවල අකුරට වැඩකිරීම් අරඹා තිබේ. සමහර වතුවල කම්කරුවන් කලු කොඩි ඔසවා විරෝධය පෑමේ පිකට් උද්ඝෝෂන පවත්වා ඇත.

කෙසේ වෙතත් කම්කරුවන්, තමන්ට තවත් බොහෝ දුර යාමට ඇති බව වටහාගත යුතුය. යහපත් වැටුප් හා ජීවන තත්ත්වයන් සඳහා කරන කුමන හෝ සටනක් හාම්පුතුන්ට මෙන්ම, කම්කරුවන් බිය වද්දා වෘත්තීය ක්‍රියාමාර්ග අත්හිටුවීම සඳහා දැනටමත් පොලීසිය හා හමුදාව යොදාගෙන තිබෙන රාජපක්ෂ ආන්ඩුවටත් එරෙහි දේශපාලන අරගලයක් බවට වේගයෙන් පරිවර්තනය වනු ඇත. වෘත්තීය සමිති මීට පෙර සිදුකර ඇති ආකාරයටම, වතු කම්කරුවන් විසින් ගෙනයන අරගලය කඩාකප්පල් කරමින් ආන්ඩුව හා මහා ව්‍යාපාරිකයන් පිටුපස පෙලගැසෙනවා නොඅනුමානය.

වෘත්තීය සමිති වලින් ස්වාධීනව බලමුලු ගැන්වෙමින් තමන්ගේම ක්‍රියාකාරී කමිටු ගොඩනැඟීම සඳහා සමාජවාදී සමානතා පක්ෂය වතු කම්කරුවන්ට කැඳවුම් කර සිටියි. මනා වැටුප් හා ජීවන තත්ත්වයන් සහතික කරන ඉල්ලීම් මාලාවක් කෙටුම්පත් කිරීමට හා ඒ සඳහා සටන් වැදීමට පුලුල් කම්කරු ව්‍යාපාරයක් දියත් කිරීමට, ක්‍රියාකාරී කමිටුවල නියෝජිතයන්ගේ සමුලුවක් කැඳවිය යුතුය.

කෙසේ වෙතත් සටන්කාමී ක්‍රියාවන් පමනක් සෑහෙන්නේ නැත. හාම්පුතුන්, ආන්ඩුව හා රාජ්‍ය

යාන්ත්‍රනය සමඟ ගැටුමක දී කම්කරු පන්තියට දේශපාලන ක්‍රියාමාර්ගයක් හා ඉදිරිදර්ශනයක් අවශ්‍යය. වැටුප් ගෙවීමට මුදල් නැතිබව හාම්පුතුන් කියන්නේ නම් අප කිව යුත්තේ, සමාගමේ ගිනුම් පොත් විවෘත කරන ලෙසයි. හාම්පුතුන් විසින් කම්කරුවන්ගෙන් සිය ලාභය උපුටාගන්නේ කෙසේදැයි එවිට අපට දැකගත හැකිවෙයි.

ගෝලීය ධනවාදයේ වත්මන් අර්බුදයට කම්කරු පන්තිය වගකිව යුතු නොවේ. වත්මන් ආර්ථික පර්යායට වැඩකරන ජනතාව සඳහා යහපත් ජීවන තත්ත්වයන් සරිකර දීමට නොහැකි නම් කල යුතුව ඇත්තේ, ධනවත් අතලොස්සකගේ නොව වැඩකරන ජනතාවගේ අවශ්‍යතාවන් ඉටුවන ආකාරයට සමාජය මුලුමනින්ම ප්‍රතිසංවිධානය කිරීමය. ඒ සඳහා ධනේශ්වරයේ සියලු කොටස් වෙතින් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය පිහිටුවා ගැනීමත්, සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම්වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටන් වැදීමත් අත්‍යවශ්‍ය වේ.

වතු කම්කරුවන්ට එය තනිව ම සපුරාගත නොහැකි වන අතර, තම රැකියා, වැටුප් හා ජීවන තත්ත්වයන් මත, ඒ හා සමානව ම ප්‍රහාර එල්ල වන කොන්දේසි වලට මුහුනදී සිටින ශ්‍රී ලංකාවේ ද ජාත්‍යන්තරව ද අවශේෂ කම්කරු කොටස් වෙත හැරිය යුතුය. ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියෙහි සෑම කොටසක්ම මෑත වසරවල ඉහල නැගුනු උද්ධමනයෙන් පීඩාවට පත්ව සිටිති. විදුලි බල හා ඉන්ධන ක්ෂේත්‍රයේ කම්කරුවන් දැනටමත් වැටුප් වැඩිකර ගැනීමේ උද්ඝෝෂනයන්හි යෙදී සිටියි.

එක්සත් ව්‍යාපාරයක හරි මැද ඇත්තේ සියලු ආකාරයේ ජාතිවාදය හා වර්ගවාදය ප්‍රතික්ෂේප කිරීමයි. 60 වසරකට වැඩි කාලයක් තිස්සේ කොලඹ බලයට පත් සෑම ආන්ඩුවක් විසින්ම, කම්කරු පන්තිය වාර්ගික රේඛා ඔස්සේ බෙදා වෙන්කිරීම සඳහා දෙමල විරෝධී ස්වෝත්තමවාදය ගසා කා තිබේ. දශක ගනනාවක දෙමල විරෝධී වෙනස්කම් කිරීම, සමස්ත දිවයිනේම වැඩකරන ජනතාවන්ට ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගෙන ආ දිග් ගැස්සුන සිවිල් යුද්ධයකට තුඩු දුන්නේය.

මෙම වාර්ගික භේදකාරීත්වය ජයගැනීම සඳහා කම්කරු පන්තිය, උතුරු නැගෙනහිර ප්‍රදේශ තුල මිලිටරි ග්‍රහනය අවසන් කිරීම හා සියලු දෙමල රැඳවියන් නිදහස් කරන ලෙස ද ඉල්ලා සිටිය යුතුය. මෙම ඉල්ලීම්, ජාත්‍යන්තරවත්, දකුනු ආසියාවේත් සමාජවාදය සඳහා පුලුල් අරගලයක කොටසක් ලෙස, ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටනෙන් නොවෙන්කල හැකිය. වතු කම්කරුවන් හැරිය යුත්තේ, තමන් හා සමානව ම නොඉවසියහැකි තත්ත්වයන් හමුවේ පීඩාවට පත්ව, ලෙව පුරා විසිර සිටින බංග්ලාදේශ, වියට්නාම්, කෙන්යා හා ඉන්දියානු කම්කරු පන්තික සහෝදර සහෝදරියන් වෙතය.

සමාජවාදී සමානතා පක්ෂය, ලෝක ට්‍රොට්ස්කිවාදයෙහි, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අනෙකුත් ශාඛාවනුත් සමඟ එක්ව ඉදිරිපත් කරන ක්‍රියාමාර්ගය මෙයයි. මෙම දේශපාලන අරගලය මෙහෙයවීම සඳහා අවශ්‍ය කෙරෙන මහජන පක්ෂය ලෙස සසප ගොඩනැඟීමට සම්බන්ධ වෙමින්, අපගේ ඉදිරිදර්ශනය හදාරන ලෙස අපි වතු කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org